# වාර්ෂික වාර්තාව

# 2018



ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්

# පටුන


1. පටුන ........................................................................................................ 2
2. සමාගම පිළිබඳ හැඳින්වීම ........................................................................ 4
3. අධ්‍යක්ෂ මණ්ඩලය ....................................................................................... 5
4. කළමනාකරණ කණ්ඩායම ............................................................................ 6
5. අංශයන්හි කාර්යසාධනය ............................................................................ 7
6. ආයතනික පාලනය ...................................................................................... 21
7. විගණිත මූල්‍ය ප්‍රකාශන ............................................................................ 23

# අපගේ දැක්ම

2024 වර්ෂයේදී ප්‍රධාන ඉන්ධන සැපයුම් මධ්‍යස්ථානය බවට පත්වීම

# අපගේ මෙහෙවර

ඉන්ධන සැපයුම් බලපත්‍රලාභීන් වෙත යටිතල / ගබඩා පහසුකම් වැඩි දියුණු කිරීම මගින් රටේ වටිනාකම උපරිම තලයට ගෙන ඒම.

# අරමුණු

- ✓ නෞකා සඳහා යොදන ඉන්ධන තෙල් ගබඩා කිරීමේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- ✓ ඉන්ධන සැපයුම් ව්‍යාපාරයේ මධ්‍යස්ථානය වශයෙන් කොළඹ තෙල් බැංකුව කාර්යක්ෂම හා ඵලදායී අන්දමින් කළමනාකරණය කිරීම
- ✓ පරිශ්‍රය තුළ නිෂ්පාදන ගබඩාවේ ආරක්ෂාව සහතික කිරීම
- ✓ සියලු සේවකයින් අතර ඉහළ මට්ටමේ ඵලදායිතාවක් වර්ධනය කිරීම හා පවත්වාගෙන යාම
- ✓ මෙහෙයුම් කටයුතුවලදී සෞඛ්‍යාරක්ෂිත, ආරක්ෂාකාරී සහ පරිසර හිතකාමී ක්‍රියාමාර්ග හඳුන්වාදීම
- ✓ පාරිභෝගිකයින් වෙත කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් සැපයීම

# සමාගම පිළිබඳ හැඳින්වීම

කොළඹ තෙල් බැංකුව වශයෙන්ද හැඳින්වෙන ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් (ජේසීටී ලිමිටඩ්) හෙවත් සීමාසහිත ජයබහලු පර්යන්ත සමාගම යනු පූර්ණ හිමිකාරීත්වය ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුවන එහි අනුබද්ධ සමාගමක් වන අතර කලාපය තුළ නැව් සඳහා අවශ්‍ය ඉන්ධන ගබඩාකර අදාළ සමාගම් වෙත බෙදාහැරීම සිදුකරන ප්‍රමුඛ පෙළේ අස්තිත්වයකි. සීමාසහිත ජයබහලු පර්යන්ත සමාගම (PB 960) 2002 පෙබරවාරි 21 වන දින 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද අතර 2008 අප්‍රේල් 25 වන දින 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ හිමිකාරීත්වය 100% ක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුවන සමාගමක් වශයෙන් ලියාපදිංචි කරන ලදී.

2008 වසරේදී, අංක 69, වෝල්ස් පටුමග, කොළඹ 15 යන ලිපිනයේ පිහිටි කොළඹ තෙල් බැංකුවේ කළමනාකරණ හා මෙහෙයුම් කටයුතු සිදු කිරීමේ කාර්යය ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ජයබහලු පර්යන්ත සමාගම වෙත පවරන ලදී. ඉන්ධන සැපයුම් බලපත්‍රලාභීන් වෙත නැව් සඳහා යොදන ඔවුන් විසින් ආනයනය කරනු ලබන ඉන්ධන ගබඩා කර තැබීමට පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ අනුමැතිය ලද පොදු ගුදමක් (Public Bond) වශයෙන් ස්ථාපනය කරන ලද එකී තෙල් බැංකුවේ කළමනාකරණ හා මෙහෙයුම් කටයුතු සිදු කිරීම මෙම සමාගමේ ප්‍රධාන කාර්යය වේ. සීමාසහිත ජයබහලු පර්යන්ත සමාගමේ මූලික ව්‍යාපාර වන්නේ නෞකාවලට සපයන ඉන්ධන ගබඩා කිරීම සහ මුහුදේදී නෞකාවලට ඉන්ධන සැපයුම් කරන සමාගම්වලට ඉන්ධන සැපයීම වේ. නෞකාවලට සපයන HFO 380 හා IFO 180 වර්ගයේ ඉන්ධන තෙල් සහ වායු තෙල් (MGO) මෙම පරිශ්‍රය තුළ ගබඩා කර තැබේ. මෙම ඉන්ධන ගබඩා කළ හැකි විශාල ටැංකි 13 ක් වර්තමානයේ මෙම සමාගම සතුවන අතර එහි සම්පූර්ණ ධාරිතාව මෙට්‍රික් ටොන් 35,000 ක් වේ. කොළඹ 15 බ්ලූමැන්ඩල් ප්‍රදේශයේ අක්කර 9 කට වැඩි භූමි ප්‍රදේශයක මෙය පිහිටා තිබේ.

තෙල් බැංකුවේ පහසුකම් ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් ඉන්ධන සැපයුම් බලපත්‍රලාභී ආයතන අටක් සමග තෙල් බැංකුව ගිවිසුම්වලට එළඹ ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩලය

## 1. සුසන්ත එෆ්. එච්. ප්‍රනාන්දු මහතා - සභාපති

සුසන්ත එෆ්. එච්. ප්‍රනාන්දු මහතා සභාපති හා අධ්‍යක්ෂ වශයෙන් සීමාසහිත ජය බහලු පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට 2017.05.30 දින පත්වූ අතර 2019.03.01 වන දින ඉල්ලා අස්වන තෙක් ප්‍රනාන්දු මහතා එම තනතුරුවල කටයුතු කළේය.

## 2. ආර්.ඒ.ඩී.ඒ.එම්. රූපසිංහ මහතා / එම්.එම්.එම්. අම්ජාඩ් මහතා

### කළමනාකාර අධ්‍යක්ෂ/අධ්‍යක්ෂවරු

ආර්.ඒ.ඩී.ඒ.එම්. රූපසිංහ මහතා කළමනාකාර අධ්‍යක්ෂ හා අධ්‍යක්ෂ වශයෙන් සීමාසහිත ජය බහලු පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට 2017.05.30 දින පත්වූ අතර 2018.10.25 වන දින ඉල්ලා අස්වන තෙක් රූපසිංහ මහතා එම තනතුරුවල කටයුතු කළේය.

එම්.එම්.එම්. අම්ජාඩ් මහතා කළමනාකාර අධ්‍යක්ෂ හා අධ්‍යක්ෂ වශයෙන් සීමාසහිත ජය බහලු පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට 2018.10.25 දින පත්වූ අතර 2018.12.31 වන දින දක්වා එම තනතුරුවල කටයුතු කළේය.

## 3. අධ්‍යක්ෂ මණ්ඩලය

i. ඩී.සී.ඩබ්ලිව්. හපුගොඩ මහත්මිය - අධ්‍යක්ෂ – භාණ්ඩාගාර නියෝජිත

ii. යූ.එල්.යූ.ඩී.එස්. ගුණසිංහ මහතා – අධ්‍යක්ෂ

iii. පී.ජී. දසනායක මහතා – අධ්‍යක්ෂ

iv. එන්.ඒ.එස්. වික්‍රමසිංහ මහතා –අධ්‍යක්ෂ

v. ප්‍රියන්ත කන්නන්ගර මහතා – අධ්‍යක්ෂ

vi. ඩබ්ලිව්.ඒ.එස්. පෙරේරා මහතා - අධ්‍යක්ෂ

vii.. එච්.ඒ. විමලසූරිය මහතා – අධ්‍යක්ෂ ( 2018.05.20 දින අභාවප්‍රාප්ත වූයේය)

# කළමනාකරණ කණ්ඩායම

## 1. ලොරින් ද සිල්වා ( නීති හා මානව සම්පත් කොට්ඨාස ප්‍රධානී )

ලොරින් ද සිල්වා මහත්මිය 2009 වසරේදී නීති නිලධාරී/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් වශයෙන් සීමාසහිත ජය බහලු පර්යන්ත සමාගමට සම්බන්ධ වූවාය. වෘත්තියෙන් නීතිඥවරියක් වන ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයෙන් උපාධිය සමත්ව එම විශ්වවිද්‍යාලයෙන් නීතිය පිළිබඳ පශ්චාත් උපාධියත් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියත් ලබාගෙන තිබේ. සීමාසහිත ජය බහලු පර්යන්ත සමාගමට සම්බන්ධ වීමට පෙර එම මහත්මිය ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යංශයේත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේත් සේවය කර තිබේ. ඇය 2016 වසරේදී මානව සම්පත් හා නීති ප්‍රධානී තනතුරට උසස්කිරීම සිදු කරන ලදී.

## 2. සුගන්ධිකා එම් ලංසකාර ( මූල්‍ය කොට්ඨාස ප්‍රධානී )

සුගන්ධිකා ලංසකාර මහත්මිය 2009 වසරේ ජූලි මාසයේදී ගණකාධිකාරී වශයෙන් සීමාසහිත ජය බහලු පර්යන්ත සමාගමට සම්බන්ධ වූවාය. කළමනාකරණ ගණකාධිකාරීවරියක් වන ඇය වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවකි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය විෂයය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධියක්ද ලබා ඇති ඇය 2012 වසරේදී මූල්‍ය ප්‍රධානී තනතුරට උසස් කරනු ලැබුවාය.

## 3. නලින් විතානපතිරණ ( ඉංජිනේරු කොට්ඨාස ප්‍රධානී )

නලින් විතානපතිරණ මහතා 2010 වසරේ පෙබරවාරි මාසයේදී යාන්ත්‍රික ඉංජිනේරු වශයෙන් සීමාසහිත ජය බහලු පර්යන්ත සමාගමට සම්බන්ධ විය. යාන්ත්‍රික ඉංජිනේරුවරයෙක් වන එම මහතා ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ (IESL) ආශ්‍රිත සාමාජිකයෙකි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක්ද ලබා ඇති ඔහු 2012 වසරේදී ඉංජිනේරු අංශ ප්‍රධානී තනතුරට උසස් කරන ලදී.

## 4. නලින්ද රාජසිංහ ( ව්‍යාපාර සංවර්ධන හා මෙහෙයුම් කොට්ඨාස ප්‍රධානී )

නලින්ද රාජසිංහ මහතා 2010 වසරේ ජුනි මාසයේදී ව්‍යාපාර සංවර්ධන හා මෙහෙයුම් ප්‍රධානී වශයෙන් සීමාසහිත ජය බහලු පර්යන්ත සමාගමට සම්බන්ධ විය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිධාරියෙක් වන ඒ මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධිය හදාරමින් සිටී. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක්ද ලබා තිබේ.

# අංශයන්හි කාර්යසාධනය

## 1. මෙහෙයුම් අංශය – මෙහෙයුම් පිළිබඳ සමාලෝචනය

ඉන්ධන සැපයුම් බලපත්‍රලාභී ආයතන විසින් කොළඹ වරාය හරහා කොළඹ තෙල් බැංකුව වෙත නෞකාවලට යොදන ඉන්ධන ආනයනය කිරීම හා ටැංකි තුළින් තෙල් ඉවත් කිරීම අදාළ ගාස්තු ගෙවීමට යටත්ව සිදු කරනු ලබයි. අදාළ සමාගම විසින් නැංගුරම් ලා තිබෙන ඉන්ධන සැපයුම් බත්තල සහ තෙල් නෞකා වෙත ඉන්ධන පැටවීමේ කාර්යයේදී ගබඩා සහ හැසිරවීමේ පහසුකම් සැපයීම සීමාසහිත ජය බහලු පර්යන්ත සමාගම විසින් සිදු කෙරේ. කොළඹ තෙල් සමාගම තුළ වර්තමානයේ ඉන්ධන සැපයුම් බලපත්‍රලාභී ආයතන නවයක් මෙහෙයුම් කටයුතු සිදු කරයි. සීමාසහිත ජය බහලු පර්යන්ත සමාගමේ ඉන්ධන ටැංකි තුළ පහත නිෂ්පාදන ගබඩා කෙරේ.

- නෞකාවලට යොදන (MFO 380 CST) වර්ගයේ ඉන්ධන තෙල්
- නෞකාවලට යොදන තෙල් (MGO)
- නෞකාවලට යොදන (MFO 180 CST) වර්ගයේ ඉන්ධන තෙල්

**2012 වසරේ නෞභාර දත්ත විශ්ලේෂණය.**

පහත වගුව හා ප්‍රස්තාරය අනුව 2012 වසරේදී නිෂ්පාදන වර්ග තුනට අදාළ දත්ත මෙසේය - 380 CST වර්ගයේ ඉන්ධන තෙල් 67% ක් හා MGO තෙල් 20% ක් වන අතර 180 CST වර්ගයේ ඉන්ධන තෙල් 13% ක් පමණි.

| විස්තරය | 2012 (මෙට්‍රික් ටොන්) |
|---|---|
| 380 Cst | 241,391.747 |
| MGO | 71,205.243 |
| 180 Cst | 48,059.557 |




**2017 වසරේ නෞභාර දත්ත විශ්ලේෂණය.**

2017 වසරේ නෞභාර විශ්ලේෂණය පහත වගුව හා ප්‍රස්තාරය මගින් දැක්වේ.

| විස්තරය | 2017 (මෙට්‍රික් ටොන්) |
|---|---|
| 380 Cst | 481,238.781 |
| MGO | 52,006.879 |
| 180 Cst | 23,626.928 |




මෙම වට ප්‍රස්තාරයෙන් දැක්වෙන නෞභාර දත්ත වාර්තා අනුව 380 Cst වර්ගයේ ඉන්ධන තෙල් 87% කද MGO තෙල් හා 180 Cst වර්ගයේ ඉන්ධන තෙල් පිළිවෙලින් 9% ක හා 4% ක ද අගයක් ගෙන ඇත.

**2018 වසරේ නෞභාර දත්ත විශ්ලේෂණය.**

| විස්තරය | 2018 මෙට්‍රික් ටොන් |
|---|---|
| 380 Cst | 533176.16 |
| MGO | 48593.146 |
| 180 Cst | 19820.99 |




ඉහත වගුව/ප්‍රස්තාරය අනුව 380 Cst වර්ගයේ ඉන්ධන තෙල් සඳහා නෞභාරය ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින ආකාරය දැකිය හැකි අතර එය 2018 වසරේදී මුළු ප්‍රමාණයෙන් 89% ක් බවට වර්ධනය වී ඇත. MGO තෙල් හා 180 Cst වර්ගයේ ඉන්ධන තෙල් පිළිවෙලින් 8% ක හා 3% ක ද අගයක් ගෙන ඇත.

2012 සහ 2017 වසර අතර කාලයේ නෞභාර දත්ත විශ්ලේෂණය කිරීමේදී 380 Cst වර්ගයේ ඉන්ධන තෙල් සඳහා නෞභාරය විශාල වශයෙන් ඉහළ යාමක් දැකිය හැකිය. 2012 වසරේ මෙට්‍රික් ටොන් 241,391.747 ක් වූ එම අගය වර්තමානය වනවිට මෙට්‍රික් ටොන් 533,176.160 ක් වී තිබේ. 180 Cst වර්ගයේ ඉන්ධන තෙල් සඳහා අගය මෙම කාලය තුළ පහළ ගොස් ඇත. 2012 වසරේදී මෙට්‍රික් ටොන් 48,059.557 ක් වූ එම අගය 2017 වසරේදී මෙට්‍රික් ටොන් 23,626.928 ක් දක්වා අර්ධයකයට ආසන්න ප්‍රමාණයකින් අඩු වී ඇත. 2018 වසරේදී එය මෙට්‍රික් ටොන් 19,820.990 දක්වා තවදුරටත් පහළ ගොස් ඇත.




380 Cst වර්ගයේ ඉන්ධන තෙල් හා 180 Cst වර්ගයේ ඉන්ධන තෙල් සමග සැසඳීමේදී MGO තෙල් සඳහා නෞභාරය 2017 හා 2018 වසරවලදී පිළිවෙලින් මෙට්‍රික් ටොන් 52,006.879 හා මෙට්‍රික් ටොන් 48,593.146 ලෙස දළ වශයෙන් එකම ප්‍රමාණයක පැවතී ඇත. 2012 වසර හා සැසඳීමේදී එහි පැහැදිලි අඩුවීමක් දැකිය හැකිය. ඒ 2012 වසරේ මෙට්‍රික් ටොන් 71205.243 ක් හා 2018 වසරේදී මෙට්‍රික් ටොන් 48593.146 ක් වශයෙනි.



## 2. මූල්‍ය අංශය – මූල්‍ය සමාලෝචනය

රෙගුලාසිමය වෙනස්කම් බලාත්මක වීමත් සමග බොහෝ අභියෝගයන්ට මුහුණපෑමට සිදුවීම හේතුවෙන් 2018 මූල්‍ය වර්ෂය දුෂ්කර වූ වසරක් විය. 2017 අංක 24 දරන නව දේශීය ආදායම් පනත අනුව බන්ධිත ගුදමක ව්‍යාපාර කටයුතු නිශ්චිත ව්‍යාපාරය යන අර්ථයට ගැළපෙන අතර නිශ්චිත ව්‍යාපාර යටතට ගැනෙන ව්‍යාපාරවලින් ලැබෙන ලාභයයෙන් 14% ක බදු අය කරන ලදී. එබැවින් 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 13 (yyyy) වගන්තිය යටතේ එම බද්දෙන් නිදහස් වීම නව පනත මගින් නතර වී ඇත. මෙම රෙගුලාසිමය වෙනස හේතුවෙන් සීමාසහිත ජය බහලු පර්යන්ත සමාගම 2018 වසර සඳහා ආදායම් බදු වශයෙන් රුපියල් මිලියන 21.3 ක් ගෙවා ඇත. 2017 වසර සමග සැසඳීමේදී එය 73% ක ඉහළ යාමක් වන අතර එමගින් ලාභය කෙරෙහි අති විශාල බලපෑමක් එල්ල වී ඇත.

පසුගිය වසර පහ තුළ සමාගමේ මූල්‍ය ප්‍රගතිය පහත වගුව මගින් දැක්වේ.

| වර්ෂය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| ආදායම | 146,634,900 | 169,751,023 | 203,928,350 | 247,033,670 | 287,571,286 |
| දළ ලාභය | 78,460,957 | 61,670,164 | 111,607,314 | 137,402,393 | 144,242,855 |
| මෙහෙයුම් ලාභය | 18,758,243 | 28,872,097 | 58,477,533 | 75,893,979 | 63,304,163 |
| ශුද්ධ ලාභය | 29,822,958 | 36,805,921 | 77,651,525 | 104,736,091 | 91,294,628 |

2014 සිට 2018 වසර දක්වා කාලය තුළ වාර්තා වූ ආදායම සහ ශුද්ධ ලාභය පහත ප්‍රස්තාරය මගින් දැක්වේ.




සීමාසහිත ජය බහලු පර්යන්ත සමාගම එහි ඉහළ මට්ටමේ කාර්යසාධනය අඛණ්ඩව පවත්වා ගනිමින් 2018 වසරේදී රුපියල් මිලියන 287.5 ක ආදායමක් වාර්තා කළ අතර 2017 වසර හා සැසඳීමේදී එය 16% ක වර්ධනයකි. ටැංකි තුළට තෙල් පිරවීමේ හා ටැංකි තුළින් තෙල් ඉවත් කිරීමේ මෙහෙයුම්වල වර්ධනය සහ විනිමය අනුපාත උච්ඡාවචනය මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. නෞකා සඳහා යොදන ඉන්ධන ටැංකි තුළට පිරවීම හා ටැංකි තුළින් ඉවත් කිරීම පිළිවෙලින් 8% කින් හා 9% කින් ඉහළ ගොස් ඇත. සපයනු ලබන සේවාවන්ට අදාළ ආදායම සඳහා ඉන්වොයිසි පිළියෙල කිරීමේ සහ වාර්තා සකස් කිරීමේ සියලු කටයුතු ගණුදෙනුව සිදුකෙරෙන දිනට අමෙරිකානු ඩොලරයේ අගය රුපියල් බවට හැරවීම මගින් සිදු කෙරේ. 2017 වසර සඳහා සාමාන්‍ය විනිමය අනුපාතය අමෙරිකානු ඩොලර් 155 ක් වූ අතර 2018 වසරේදී එය අමෙරිකානු ඩොලර් 180 ක් විය.

සීමාසහිත ජය බහලු පර්යන්ත සමාගම 2018 වසරේදී වාර්තා කළ බදු පෙර ලාභය රුපියල් මිලියන 112.6 කි. මූල්‍ය ආදායම රුපියල් මිලියන 49.6 ක් වන අතර 2017 වසර හා සසඳන විට එය 19% ක වර්ධනයකි. රුපියල් මිලියන 91.29 ක් වන සමාගමේ ශුද්ධ ලාභය 2017 වසර හා සන්සන්දනය කිරීමේදී 14.8% කින් පහළ ගොස් ඇත.




2018 වර්ෂය තුළ සමාගමේ මූල්‍ය තත්වයට අදාළව පවතින හිතකර තත්වය පහත අනුපාත විශ්ලේෂණය මගින් දැක්වේ.

| | 2017 | 2018 |
|---|---|---|
| 1. දළ ලාභ ඉම | 55.62% | 50.16% |
| 2. ශුද්ධ ලාභාන්තිකය | 42.39% | 31.62 % |
| 3. යෙදවූ ප්‍රාග්ධනය සඳහා ප්‍රතිලාභ | 20.33% | 15.13% |
| 4. ජංගම අනුපාතය | 24.71% | 17.98% |
| 5. තෝලනය | 7.24% | 6.25% |
| 6. ලාභාංශ ආවරණය | 15.40% | 90.94% |
| 7. කොටසකට ඉපැයුම් | 1047.36 | 912.95 |

### 3. ඉංජිනේරු අංශය

ඉංජිනේරු අංශයේ ප්‍රධාන වගකීම වනුයේ එන්ජින් පොම්ප, ඉන්ධන ගබඩා කරන ටැංකි, බොයිලේරු, ඉන්ධන බෙදාහැරීමේ නළ මාර්ග, ගොඩනැගිලි, වාහන සහ අනෙකුත් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සඳහා නිසි අයුරින් නඩත්තු වැඩසටහන් සැලසුම් කිරීමත් ඒවා ක්‍රියාත්මක කිරීමත්ය. එයට අමතරව සියලුම පිරිසැකසුම් කාර්යයන්, සිවිල් ඉංජිනේරු හා විදුලි ඉංජිනේරු කටයුතු, තෙල් පර්යන්තයේ ගිනි ආරක්ෂාව සහ අංගන නඩත්තු කටයුතු යනාදිය පිළිබඳ වගකීමද ඉංජිනේරු අංශය විසින් දරනු ලබයි.

## 2010-2018 කාල සීමාව තුළදී සිදු කරන ලද ප්‍රධාන ව්‍යාපෘති

**අ)** බ්ලූමැන්ඩල් තෙල් පර්යන්තයේ සිට කොළඹ වරාය දක්වා අතුරා ඇති හානි වූ සහ පළුදු වූ ඉන්ධන තෙල් බෙදාහැරීමේ වානේ නළ මාර්ග හේතුවෙන් නිරන්තර තෙල් කාන්දුවීම් වාර්තා වුණි. නැව් සඳහා යොදන ඉන්ධන නැව් සහ ඉන්ධන සැපයුම් බත්තල වෙත පිරවීම සහ ඉවත්කිරීම සඳහා මෙම නළ මාර්ග භාවිතා කෙරුණු අතර ඒවා මීට වසර 50 කට පෙර පිහිටුවන ලද නළ මාර්ග විය. ඉහත හේතු සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 2012 වසරේදී බ්ලූමැන්ඩල් තෙල් පර්යන්තයේ සිට කොළඹ වරායේ උමං දොරටුව දක්වා තෙල් බෙදාහැරීමේ නළ මාර්ග අලුතින් පිහිටුවීම සඳහා ව්‍යාපෘතියක් දියත් කරන ලදී. 2014 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද එම ව්‍යාපෘතිය සඳහා වැය වූ පිරිවැය දළ වශයෙන් රුපියල් මිලියන 155 ක් විය.




**ආ)** නෞකා සඳහා යොදන 380 Cst වර්ගයේ ඉන්ධන තෙල් සඳහා වන ඉල්ලුම 2010 වසරේ සිට අධිකව ඉහළ යාම හේතුවෙන් ඉන්ධන සැපයුම් බලපත්‍රලාභීන්ගේ ඉල්ලුම සඳහා පවතින අවකාශය ප්‍රමාණවත් නොවුණි.

ඉන්ධන සැපයුම් බලපත්‍රලාභීන් විසින් නිරන්තරයෙන් කරන ලද ඉල්ලීම සහ නෞකා සඳහා යොදන 380 Cst වර්ගයේ බැර ඉන්ධන තෙල් සඳහා පවතින ඉහළ ඉල්ලුම

සැලකිල්ලට ගෙන 380 Cst වර්ගයේ බැර ඉන්ධන තෙල් සඳහා මෙට්‍රික් ටොන් 5200 ක ධාරිතාවකින් යුත් නව ටැංකියක් ඉදිකිරීමට 2010 වසරේදී තීරණය කරන ලදී. 2012 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද එම ව්‍යාපෘතිය සඳහා වැය වූ පිරිවැය දළ වශයෙන් රුපියල් මිලියන 85 ක් විය.




**ඇ)** ටැංකිය ඉදිකිරීමේ කාර්යය හා සමගාමීව 380 Cst වර්ගයේ ඉන්ධන තෙල්වල තාපන ධාරිතාව උසස් කිරීමටද පියවර ගෙන තිබේ. ඒ අනුව 2012 වසරේදී ටොන් තුනක ධාරිතාවකින් යුත් බොයිලේරුවක් පිහිටුවන ලදී. ඒ සඳහා වැය වූ පිරිවැය දළ වශයෙන් රුපියල් මිලියන 3 කි.

**ඈ)** අපගේ ලියාපදිංචි ඉන්ධන සැපයුම් බලපත්‍රලාභී ආයතන සහ ශ්‍රී ලංකා රේගුව 2010 වර්ෂයේ සිට අතිරික්ත හා හිඟ ප්‍රමාණ සහ ඉන්ධනවල උෂ්ණත්වය, ඝණත්වය වැනි පරාමිතීන් සම්බන්ධයෙන් ගැටළු කිහිපයකට මුහුණ දුන්හ. එම කරුණු සැලකිල්ලට ගෙන 2014 වසරේදී 104, 102, 106 සහ 107 ටැංකි සඳහා රේඩාර් ටැංකි මිනුම් පද්ධතිය ක්‍රියාත්මක කරන ලදී. එමගින් ටැංකියේ මුදුනට නැගීමෙන් තොරව ඩෙස්ක්ටොප් පරිගනකයක් භාවිතයෙන් එක් එක් ටැංකියේ පවතින ඉන්ධනවල උෂ්ණත්වය, මට්ටම, ඝණත්වය සහ ප්‍රමාණය කියවීමට පහසුකම් සැලසී තිබේ.

**ඉ)** එන්ජින් පොම්ප ඉතාම අයහපත් තත්වයේ පැවති බැවින් හා නිරන්තරයෙන් ගැටළු මතු කළ බැවින් නෞකා සඳහා යොදන බැර ඉන්ධන තෙල් ඉන්ධන සැපයුම් බත්තල වෙත බාධාවකින් තොරව පිරවීම සිදු කෙරෙන බව සහතික කිරීම සඳහා ඉහළ ප්‍රමුඛතා පදනමක් වශයෙන් සලකා 380 Cst වර්ගයේ බැර ඉන්ධන තෙල් සඳහා නව එන්ජින් පොම්පයක් සවිකිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණයක් ගන්නා ලදී. ඒ අනුව 2018 වසරේදී 380 Cst වර්ගයේ බැර ඉන්ධන තෙල් සඳහා නව එන්ජින් පොම්ප ඒකකයක් පිහිටුවන ලදී. ඒ සඳහා දළ වශයෙන් වැය වූ පිරිවැය බදු රහිතව රුපියල් මිලියන 22 ක් විය.




**ඊ)** වායු තෙල් සඳහා නව එන්ජිමක් 2011 වසරේදී සවි කරන ලද අතර වැය වූ පිරිවැය දළ වශයෙන් රුපියල් මිලියන 2 ක් විය. එම එන්ජිමට 2012 වසරේදී නව එන්ජිමක් එක් කරන ලද අතර ඒ සඳහා දළ වශයෙන් රුපියල් ලක්ෂ 7 ක් වැය විය.

**<u>බ්ලූමැන්ඩල් තෙල් පර්යන්තයේ ගිනි ආරක්ෂාව.</u>**

*කොළඹ තෙල් බැංකුවේ ගිනි ආරක්ෂාව උසස් කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගෙන, ටැංකි සඳහා ජලය හා පෙණ භාවිතා කිරීම සඳහා, පවතින හයිඩ්‍රන් දිය නළය (fire hydrant) / අවේක්ෂණ පද්ධතිය නවීකරණය කිරීමේ අවශ්‍යතාව හඳුනාගන්නා ලදී. ඒ

අනුව, 2014 වසරේදී 101,102,103 සහ 104 ටැංකි සඳහා ගිනි පෙණ ගලා ඒමේ පද්ධතිය ස්ථාපනය කර තිබේ. ඒ සඳහා දළ වශයෙන් රුපියල් මිලියන 17 ක් වැය වී තිබේ.




* 2012 වසරේ සිට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ, කොළඹ මහ නගර සභාවේ සහ ජයබහලු පර්යන්ත සමාගමේ ගිනි ආරක්ෂණ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ඒකාබද්ධ ගිනි නිවීමේ අභ්‍යාස පවත්වා ඇත.




* හදිසි අවස්ථාවකදී අඛණ්ඩව ප්‍රමාණවත් තරම් ජලය සැපයීම සඳහා ප්‍රාකාර මාර්ගයේ (Walls lane) අන්ත ලක්ෂ්‍යයේ නව ජල කුළුණු හයිඩ්‍රන් දිය නළයක් (water pillar hydrant) පිහිටුවනු ලැබිණි.

* පසුගිය වසර කිහිපය තුළ අවශ්‍ය පෙණ, සොඬ නළ (Hoses), දිය කංචුක (fire water jacket) සහ අනෙකුත් අදාළ උපකරණ මිලදී ගන්නා ලදී.

* 2016 වසරේදී සේවාමුර සටහන සම්පූර්ණ කිරීම සඳහා ගිනි නිවන භටයන් දෙදෙනෙක් බඳවාගන්නා ලදී.

**ප්‍රවාහන හා ආරක්ෂක අංශය**

වාහන සංචිතයේ පවතින මයික්‍රෝ MPV3 වෑන් රථයේ නිරන්තරයෙන් දෝෂ මතුවීම හේතුවෙන් එම වෑන් රථය ඉවත් කොට නවීනතම ටොයෝටා වෑන් රථයක් හා ඩබල් කැබ් රථයක් ඉංජිනේරු, මෙහෙයුම් හා පරිපාලන කාර්යයන් සඳහා මිලදී ගැනීමට පියවර ගෙන තිබේ.

2012 වසරේ සිට ආරක්ෂක සේවා සපයන බාහිර ආයතනයක සේවය ලබා ගන්නා අතර තෙල් බැංකු පරිශ්‍රය ආවරණය කිරීම සඳහා හඳුනාගත් මුර පොළවල්වල එම ආරක්ෂක නිලධාරීන් යොදවා ඇත. ආරක්ෂක නිලධාරීන් 13 දෙනෙකු දිවා කල සේවා මුරයේද නිලධාරීන් 10 දෙනෙකු රාත්‍රී සේවා මුරයේද සේවය කිරීමට යොදවා තිබේ. පරිශ්‍රය තුළ ආරක්ෂාව ඉහළ දැමීම සඳහා 2016 වසරේ සිට සීසීටීවී ආරක්ෂක කැමරා පද්ධතියක් ක්‍රියාත්මක කොට තිබේ.

**අංගන නඩත්තුව**

තෙල් පර්යන්තයන්හි තණකොළ කැපීම, තෙල් වළවල් පිරිසිදු කිරීම සහ අනෙකුත් උද්‍යාන කටයුතු බාහිර ආයතනයක් විසින් සිදු කරනු ලබයි.

### 4.නීති හා මානව සම්පත් අංශය

නීති හා මානව සම්පත් අංශය අංශ ප්‍රධානී, විධායක නිලධාරී, ලිපිකරුවන් 3 දෙනෙක් සහ කාර්යාල සහායකයින් 5 දෙනෙක් යන අයගෙන් සමන්විත වේ. මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වනුයේ බඳවාගැනීම් හා පත්කිරීම්, පැමිණීම හා නිවාඩු වාර්තා කිරීම, වැටුප් සකස් කිරීම සඳහා මූල්‍ය අංශය වෙත නිසි වේලාවට වාර්තා සැපයීම, සේවකයින්ගේ සුබසාධන පහසුකම් ඇති කිරීම, EPF / ETF සඳහා අදාළ ලිපි ලේඛන සකස් කිරීම, කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් පිළියෙළ කිරීම, නෛතික කටයුතු හා අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් තනතුරේ කටයුතු සිදු කිරීම යනාදිය වේ.

2018.12.31 දිනට සමාගමේ මුළු ශ්‍රම බලකාය සේවකයින් 99 කගෙන් සමන්විත විය. 2018 වර්ෂය තුළ ස්ථිර සේවකයින් 08 දෙනෙකු හා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 03 දෙනෙකු සමාගම විසින් බඳවා ගනු ලැබූ අතර සේවකයින් 03 දෙනෙකු විශ්‍රාම ගත් අතර සේවකයින් දෙදෙනකුට ස්වේච්ඡා පදනමෙන් විශ්‍රාම ගැනීමේ අවස්ථාව ලබා දීම සිදු කරන ලදී. මූලික වැටුපට රු. 5000 ක් සහ රු. 5000 ක විශේෂ දීමනාවක් එකතු

කිරීම මගින් 2018 වසරේදී සේවකයින්ට ආකර්ශනීය වැටුප් වර්ධනයක් ලබාදෙන ලදී. තවද 2018 වසර තුළදී සේවකයින් බහුතරයකට උසස්වීම් ලබාදෙන ලදී.

සීමාසහිත ජයබහලු පර්යන්ත සමාගමේ සේවකයින්ට සමාගම තුළ පවතින වෛද්‍ය ආධාර යෝජනා ක්‍රමය යටතේ රු. 200,000/- කට යටත්ව සේවකයාටත් තවත් පවුලේ සාමාජිකයින් තිදෙනෙකුටත් රෝහල් ගත වී ප්‍රතිකාර ලබාගැනීමේ වරප්‍රසාදය හිමි වේ. ඒ අනුව 2018 වසර තුළදී සේවකයින් 39 දෙනෙක් රෝහල් ගත වී ප්‍රතිකාර ලබාගත් අතර රු. 3,171,918.80 ක මුදලක් ඒ සඳහා වැය කෙරී ඇත. එයට අමතරව වෛද්‍ය ප්‍රතිකාර ප්‍රතිපූරණය කිරීම සඳහා රු. 299,562.45 ක්ද වෛද්‍ය පරීක්ෂණවලට වැයවූ මුදල් ප්‍රතිපූරණය කිරීම සඳහා රු. 277,445.50 ක්ද ඇස් කණ්නාඩි මිලදී ගැනීමට වැය වූ මුදල් ප්‍රතිපූරණය කිරීම සඳහා රු. 90,000.00 ක්ද ගෙවා ඇත. සමාගමේ සේවකයින්ට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෛද්‍ය මධ්‍යස්ථානයෙන් හා ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයෙන් ප්‍රතිකාර ගැනීමට අවසර හිමි වන අතර බ්ලූමැන්ඩල් පර්යන්තයේ සිට ශ්‍රී ලංකා වරාය අධිකාරිය දක්වා ප්‍රවාහන පහසුකම්ද හිමි වේ.

සමාගමේ සියලු සේවකයින් පැය 24 පුරා පුද්ගලික හදිසි අනතුරු රක්ෂණාවරණයකින් රැකවරණය ලබන අතර එම රක්ෂණාවරණය යටතේ රුපියල් මිලියන 76,071.43 ක් ගෙවා ඇත. කම්කරු වන්දි පනත යටතේ හිමිකම් ඉල්ලීම් සිදු කෙරී නැත.

සේවකයින් විසින් කරන ලද ඉල්ලීමක් සලකා බලා 2018 වසරේදී ලංකා බැංකුව හා එක්ව රුපියල් මිලියන 2 දක්වා වූ නිවාස ණය පහසුකමක් හඳුන්වාදෙන ලද අතර සේවකයින් 05 දෙනෙකු වෙත එම පහසුකම ලබා දුණි. මාස 10 ක මුළු වැටුප වන රුපියල් 250,000.00 ක් ලබාගත හැකි ආපදා ණයට අමතරව බහුකාර්ය ණය සහ රුපියල් 10,000.00 අලුත් අවුරුදු ණය 4.2% ක පොළී අනුපාතයක් යටතේ සපයන ලදී.

නීති හා මානව සම්පත් අංශය 2018 වසර තුළදී සේවකයින් සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, ප්‍රසම්පාදන පරිපාටිය, ආයතන පරිපාටිය, බොයිලේරු මෙහෙයුම් යනාදී ක්ෂේත්‍ර තුළ පුහුණු වැඩසටහන් 15 ක් පමණ රුපියල් 380,056.75 ක මුළු පිරිවැයක් දරමින් සංවිධානය කොට ඇත.

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ සේවකයෙකුගේ /පියාගේ /මවගේ /මාමණ්ඩියගේ /නැන්දම්මාගේ මරණය වෙනුවෙන් රුපියල් 540.000 ක මුළු මුදලක් ගෙවා ඇත. තවද, සියලු ස්ථිර සේවකයින්ගේ දරුවන්ට විශ්වවිද්‍යාල අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ මූල්‍ය ආධාර ලබාගැනීමේ අවස්ථාව හිමිවන අතර 2018 වසර තුළ ඒ යටතේ රුපියල් 160,000.00 ක් ගෙවා තිබේ.

නෛතික කාර්යයන් සම්බන්ධයෙන් ගත් කළ, නීති හා මානව සම්පත් ප්‍රධානී විසින් නෛතික හා මානව සම්පත් ගැටළු සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා ලංකා

සේවක ෆෙඩරේෂනය හා සම්බන්ධීකරණය සිදු කරන අතර අවශ්‍ය වුවහොත් පුද්ගලික නීතිඥ මණ්ඩල වෙතින්ද නීති සේවාවන් ලබා ගැනේ. අවශ්‍ය අවස්ථාවන්හිදී ඔවුන්ගේ ගැටළු සාකච්ඡා කිරීම සඳහා සේවකයින් සමග සාකච්ඡා කිරීමට කටයුතු පිළියෙල කර දීම මගින් නීති හා මානව සම්පත් අංශය විසින් වෘත්තීය සමිති සහ අනෙකුත් සංගම්වලට තම කාර්යයන් හෝ ක්‍රියාකාරකම් සිදු කරගෙන යාම සඳහා පහසුකම් සලසනු ලබයි. නීති ප්‍රධානී කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු විනිශ්චය සභාව සහ වෙනත් අධිකරණ ඉදිරියේ සමාගම නියෝජනය කරන අතර 2018 වසරේදී අභියාචනාධිකරණය තුළ එක් කාරණයක්ද කම්කරු විනිශ්චය සභාව තුළ කාරණා 04 ක්ද මහාධිකරණය තුළ එක් කාරණයක්ද කම්කරු කොමසාරිස් ඉදිරියේ විමර්ශන 02 ක් ද නීති හා මානව සම්පත් ප්‍රධානී විසින් හසුරුවා තිබේ. තවද, අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් තනතුරේ කටයුතු සිදු කිරීම, මාසික පදනමෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම කැඳවීම හා පැවැත්වීමට කටයුතු පිළියෙල කිරීම, අධ්‍යක්ෂ මණ්ඩල පොත් හා මෙමෝ ආදිය සකස් කිරීම සිදු කරන ලදී.





# ආයතනික පාලනය

ආයතනික පාලනය යනු සංවිධාන විසින් තම සියලු පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සැපිරෙන අන්දමින් සම්පත් ඵලදායී ලෙස භාවිතයට ගැනීම සහ සංවිධානය මෙහෙයවීම හා පාලනය කිරීම සඳහා යාන්ත්‍රණයක් ඇතිකරනු ලබන ක්‍රියා පිළිවෙළය. යහ පාලනය පවත්වාගැනීමේ මූලික වගකීම සමාගමේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන අතර තම සමාගම්වල පාලනය පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. සමාගමේ උපායමාර්ගික අරමුණු තීරණය කිරීම, ඒවා සාක්ෂාත් කරගැනීමට නායකත්වය සැපයීම, ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතු අධීක්ෂණය කිරීම සහ කොටස්කරුවන් වෙත ඔවුන්ට  භාර වන වගකීම් වාර්තා කිරීම යනාදිය අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරෙන වගකීම් අතර වේ.

සමාගමේ පාලනය පිළිබඳ වගකීමද අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. යහපත් භාවිතයන් යොදා ගැනෙන බව සහතික කිරීම සඳහා නීති හා රෙගුලාසි, ව්‍යුහයන් සහ ක්‍රියාවලීන් සංවර්ධනය කිරීම කෙරෙහි සැලකිය යුතු අවධානයක් සමාගම විසින් අඛණ්ඩව යොමු කරනු ලැබේ.

මූල්‍ය වර්ෂය තුළ සමාගම විසින් ආයතනික යහ පාලන භාවිතයන් යොදා ගන්නා ලද ආකාර පහත ශීර්ෂ යටතේ ලැයිස්තුගත කෙරේ:

- අධ්‍යක්ෂ මණ්ඩලය
- විගණන කමිටු
- අභ්‍යන්තර විගණන
- මහා භාණ්ඩාගාරය සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය සමග සම්බන්ධතාව
- ව්‍යවස්ථාපිත සහ නෛතික අවශ්‍යතා සමග අනුකූලතාව

### ✓ අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂවරු 8 දෙනෙක් යන පිරිසගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. සමාගම ක්‍රියාත්මක වන කර්මාන්ත ක්ෂේත්‍රය තුළ අත්දැකීම් සමග ඉහළම මට්ටමේ වෘත්තීය සහ පුද්ගලික ආචාර ධර්ම හා වටිනාකම් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සතු විය යුතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් පත් කරනු ලබන්නේ පහත ආකාරයටය: සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ සහ තවත් අධ්‍යක්ෂවරු 7 දෙනෙක් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අතර මූල්‍ය විෂයය භාර අමාත්‍යවරයා විසින් මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙක් නම් කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය නිතිපතා රැස්වන අතර සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය නව වතාවක් රැස් වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට තම රාජකාරි ඉටු කිරීම සඳහා අවශ්‍ය වන තොරතුරු වෙත කාලීන අන්දමින් ප්‍රවේශ වීමේ හැකියාව පවතී. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් එහි සභාපතිවරයා සමග සාකච්ඡා කොට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රය සකස් කරන අතර සෑම රැස්වීමකටම පෙර සවිස්තර තොරතුරු වාර්තාවක් සියලු අධ්‍යක්ෂවරුන් වෙත ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සාකච්ඡා කෙරෙන කරුණු අතරට මෙහෙයුම් හා මූල්‍ය කාර්ය සාධන දර්ශක පිළිබඳ සමාලෝචන, ප්‍රාග්ධන වියදම් යෝජනා සඳහා අදාළ සීමාවන් ඇතුළත අනුමැතිය ලබාදීම යනාදිය ඇතුළත් වේ.

### ✓ විගණන කමිටු

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙක් වන මහා භාණ්ඩාගාරයේ නියෝජිතවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ තවත් අධ්‍යක්ෂවරු දෙදෙනෙක් යන පිරිසගෙන් විගණන කමිටුව සමන්විත වේ. සමාගම සඳහා නව අභ්‍යන්තර විගණකවරයෙකු බඳවාගැනීමෙන් අනතුරුව 2018 වසරේදී විගණන කමිටු රැස්වීම් කැඳවන ලදී. ප්‍රතිපත්ති, පාලන සහ පරිපාටීන් මෙන්ම අභ්‍යන්තර විගණකගේ වාර්තා, රජයේ විගණනයේ කළමනාකරණ ලිපි, විගණන විමසුම් යනාදියද සමාලෝචනය කිරීම, ඔවුන්ගේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසු විපරම සිදු කිරීම සහ අංශ ප්‍රධානීන් ඒ අනුව කටයුතු කරන බව සහතික කිරීම විගණන කමිටුව විසින් සිදු කරනු ලබයි.

### ✓ අභ්‍යන්තර විගණන

අභ්‍යන්තර විගණකවරයෙකුගේ ප්‍රධානත්වයෙන් අභ්‍යන්තර විගණන අංශය ක්‍රියාත්මක වේ. මෙය ස්වාධීනව කටයුතු කරන අංශයක් වන අතර සභාපතිවරයා සහ විගණන කමිටුව වෙත සෘජුව වාර්තා කරයි.

ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්

මූල්‍ය ප්‍රකාශය

2018 දෙසැම්බර් 31

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } පීඕඑස්/ඒ/ජේසීටීඑල්/1/18/1    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2019 මැයි 14 දින

සභාපති

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් හි 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

යතෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් : 01. ලේකම් - වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය.

02. ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

03. සභාපති - ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. පීඑස්/ඒ/ජේසීටීඑල්/1/18/1 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2019 මැයි 14 දින

සභාපති

ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්

**ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් හි 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් හි 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ ප්‍රකාශනය සහ වෙනත් විස්තිරණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ

බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (1) (ඈ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති වලට යොමුව | විස්තරය |
|---|---|---|
| (ඈ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී12 දරණ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති යහපාලනය පිළිබඳ චක්‍රලේඛයේ 5.1.1 වගන්තිය. | සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින්ම සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් සමාගම විසින් 2018 දෙසැම්බර් 31 දින වන විටත් එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) තෙල් ටැංකි 13 හි තෙල් නිමානය කිරීම සඳහා නවීන තාක්ෂණික උපකරණ භාවිතා නොකිරීම හේතුවෙන් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අවස්ථා 5 කදී අතිරික්ත වූ තෙල් තොග මෙට්‍රික් ටොන් 3323 ක් ශ්‍රී ලංකා රේගුව විසින් රාජසන්තක කර තිබුණි.

(ආ) ගොඩනැගිලි සැලැස්මක් සකස් කිරීම වෙනුවෙන් වර්ෂ 4 කට වැඩි කාලයක සිට ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් සමාගමට ලැබිය යුතු වූ රු. 5,779,760 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර ගෙන නොතිබුණි. තවද එම මුදල ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ගෙවිය යුතු ශේෂයක් ලෙස ඇතුලත් කර නොතිබුණි. එම මුදල අය කර ගැනීම අවිනිශ්චිත බව විගණනයේදී නිරීක්ෂණය වුවද සමාගම විසින් වර්ෂය තුළ ඒ සඳහා ප්‍රතිපාදනයන් කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

## ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්

ලාභ හෝ පාඩු පිළිබඳ ප්‍රකාශය
2018 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

| | සටහන | 2018 | 2017 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **ආදායම** | 3 | **287,571,286** | **247,033,670** |
| විකුණුම් පිරිවැය | 24 | (143,328,431) | (109,631,277) |
| **දළ ලාභය** | | 144,242,855 | 137,402,393 |
| පරිපාලන වියදම් | 25 | (80,938,692) | (61,508,414) |
| **මෙහෙයුම් ලාභය** | | **63,304,163** | **75,893,979** |
| මූල්‍ය ආදායම | 4.1 | 49,651,749 | 41,601,847 |
| මූල්‍ය පිරිවැය | 4.2 | (551,000) | (651,369) |
| මෙහෙයුම් නොවන ආදායම | | 211,748 | 220,351 |
| **බදුවලට පෙර ලාභය** | | 112,616,660 | 117,064,808 |
| ආදායම් බදු වියදම් | 13 | (21,322,032) | (12,328,717) |
| **වසරේ ලාභය** | | **91,294,628** | **104,736,091** |
| කොටසකට ඉපයුම | 15 | 912.95 | 1,047.36 |

8 පිටුවේ සිට 25 පිටුව දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටස් වේ.

# ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්

## වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2018 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

| | 2018 | 2017 |
|---|---|---|
| | රු. | රු. |
| වසරේ ලාභය | 91,294,628 | 104,736,091 |
| **වෙනත් විස්තීර්ණ ආදායම** | | |
| ***පසු කාලයේදී ලාභය හෝ පාඩුව ලෙස නැවත වර්ගීකරණය කෙරෙනු ඇත*** | | |
| ආයුගණක ලාභය/නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් අලාභය | (3,615,773) | 1,352,528 |
| **බදුවලින් පසු වෙනත් විස්තීර්ණ ආදායම** | (3,615,773) | 1,352,528 |
| **බදුවලින් පසු වෙනත් මුළු විස්තීර්ණ ආදායම** | **87,678,855** | **106,088,619** |

8 පිටුවේ සිට 25 පිටුව දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටස් වේ.

**ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්**

**මූල්‍ය තත්ව පිළිබඳ ප්‍රකාශනය**

**2018 දෙසැම්බර් 31 වන දිනට**

| | සටහන | 2018 | 2017 |
|---|---|---|---|
| **වත්කම්** | | රු. | රු. |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 5 | 49,253,891 | 18,356,741 |
| | | **49,253,891** | **18,356,741** |
| **ජංගම වත්කම්** | | | |
| අවසන් තොග | | 3,194,824 | - |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 6 | 75,501,602 | 61,527,333 |
| වෙනත් ජංගම මූල්‍ය වත්කම් | 7 | 197,219,946 | 146,039,359 |
| මුදල් හා මුදල් සමාන දෑ | 8 | 308,812,510 | 310,095,791 |
| | | 584,728,882 | 517,662,483 |
| **මුළු වත්කම්** | | **633,982,773** | **536,019,224** |
| | | | |
| **ස්කන්ධ සහ බැරකම්** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 9 | 1,000,000 | 1,000,000 |
| රඳවාගත් ඉපැයුම් | | 590,223,177 | 503,544,322 |
| **මුළු ස්කන්ධ** | | **591,223,177** | **504,544,322** |
| | | | |
| **ජංගම නොවන බැරකම්** | | | |
| පොලී දරන ණය සහ ණය ගැනුම් | 10 | 2,054,986 | 3,424,990 |
| සේවක ප්‍රතිලාභ වගකීම | 11 | 9,991,606 | 5,728,899 |
| | | **12,046,592** | **9,153,889** |
| **ජංගම බැරකම්** | | | |
| පොලී දරන ණය සහ ණය ගැනුම් | 10 | 1,370,004 | 1,370,004 |
| ගෙවිය යුතු ආදායම් බදු | 13 | 12,870,020 | 6,067,710 |
| විලම්භිත බදු බැරකම් | 14 | 115,834 | - |
| වෙනත් ගෙවිය යුතු දෑ | 12 | 16,357,146 | 14,883,299 |
| | | 30,713,004 | 22,321,013 |
| **මුළු ස්කන්ධ සහ බැරකම්** | | **633,982,773** | **536,019,224** |

මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කරන ලද බවට සහතික කරමි.

.......................................

මූල්‍ය නිලධාරි

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේ. ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 8 පිටුවේ සටහන්වල සිට ආකෘතිය 25 දක්වා වන කොටස මූල්‍ය ප්‍රකාශනවල අත්‍යන්ත කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබා ඇත.

| | | |
|---|---|---|
| .................................. | ....................................... | ....................................... |
| **සභාපති** | අධ්‍යක්ෂ | **අධ්‍යක්ෂ** |

18-Mar-2019

කොළඹ

## ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්

## ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

### 2018 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය<br>රු. | රඳවාගත් ඉපැයුම්<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|
| **2017 ජනවාරි 01 වන දිනට ශේෂය** | 1,000,000 | 404,257,703 | 405,257,703 |
| වසරේ ලාභය | | 104,736,091 | 104,736,091 |
| ගෙවූ ලාභාංශ | | (6,802,000) | (6,802,000) |
| බදුවලින් පසු වෙනත් විස්තීර්ණ ආදායම | | 1,352,528 | 1,352,528 |
| **2017 දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | 1,000,000 | 503,544,322 | 504,544,322 |
| වසරේ ලාභය | | 91,294,628 | 91,294,628 |
| ගෙවූ ලාභාංශ | | (1,000,000) | (1,000,000) |
| බදුවලින් පසු වෙනත් විස්තීර්ණ ආදායම | | (3,615,773) | (3,615,773) |
| **2018 දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | **1,000,000** | **590,223,177** | **591,223,177** |

8 පිටුවේ සිට 25 පිටුව දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටස් වේ.

## ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2018 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

| | සටහන | 2018 | 2017 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ** | | | |
| ආදායම් බදු වියදම්වලට පෙර ශුද්ධ ලාභය | | 112,616,660 | 117,064,808 |
| | | | |
| පහත දෑ සඳහා ගැලපීම්; | | | |
| ක්ෂය වීම | 5.0 | 5,573,278 | 5,629,538 |
| ක්රමක්ෂය | | - | 229,310 |
| ලැබූ පොළිය | 4.1 | (49,651,749) | (41,601,847) |
| සේවක ප්‍රතිලාභ වගකීම සඳහා ප්‍රතිපාදන | 11.0 | 1,683,060 | 1,290,123 |
| මූල්‍ය පිරිවැය | 4.2 | 551,000 | 651,369 |
| කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය | | 70,772,249 | 83,263,301 |
| | | | |
| තොග (වැඩිවීම)/අඩුවීම | | (3,194,824) | - |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑවල (වැඩිවීම)/අඩුවීම | | (13,974,269) | 888,964 |
| වෙනත් ගෙවීම්වල (වැඩිවීම)/අඩුවීම | | 1,473,847 | (432,933) |
| මෙහෙයුම්වලින් උත්පාදිත මුදල් | | 55,077,003 | 83,719,332 |
| | | | |
| ගෙවන ලද මූල්‍ය පිරිවැය | 5.2 | (551,000) | (651,369) |
| ගෙවන ලද ආදායම් බදු | | (14,403,888) | (9,763,970) |
| ගෙවන ලද සේවක ප්‍රතිලාභ වගකීම | 11.0 | (1,036,126) | (214,934) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් | | 39,085,989 | 73,089,059 |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත්කර ගැනීම | 5.0 | (36,470,428) | (6,712,392) |
| ස්ථාවර තැන්පතු තුළ ආයෝජනය | | (51,180,587) | (74,832,356) |
| ලැබූ පොළිය | 4.1 | 49,651,749 | 41,601,847 |
| ආයෝජන ක්‍රියාකාරකම් තුළ භාවිත ශුද්ධ මුදල් | | (37,999,266) | (39,942,901) |
| | | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | |
| පොලී දරන ණය සහ ණය ගැනුම් | | (1,370,004) | (1,370,004) |
| ගෙවූ ලාභාංශ | | (1,000,000) | (6,802,000) |
| | | (2,370,004) | (8,172,004) |
| | | | |
| **මුදල් සහ මුදලට සමාන දේවල ශුද්ධ වැඩි වීම/ (අඩුවීම)** | | (1,283,281) | 24,974,154 |
| | | | |
| **වසර ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ** | | 310,095,791 | 285,121,637 |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ** | 8 | **308,812,510** | **310,095,791** |

8 පිටුවේ සිට 25 පිටුව දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටස් වේ.

**ජයා කටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්**

**මූල්‍ය ප්‍රකාශනවලට සටහන්**
**2018 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා**

**1. සංස්ථානික තොරතුරු**

**1.1 පොදු**

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් යනු 1982 පෙබරවාරි 17 වන දින සමාගම් පනත යටතේ සංස්ථාගත කර ඇති සීමිත වගකීම් සහිත සමාගමකි. 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2008 අප්‍රේල් 25 දින නැවත ලියාපදිංචි වී ශ්‍රී ලංකාවේ ස්ථාපිත කරන ලදී. ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 19, පල්ලිය වීදිය, කොළඹ 01 හි පිහිටා ඇත

**1.2 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම් ස්වභාවය**

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොළඹ තෙල් බැංකුව කළමනාකරණය කිරීමයි.

**1.3 මූල්‍ය කාල සීමාව සහ නිකුත් කිරීම සඳහා බලය ලබා දීමේ දිනය**

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් හි මූල්‍ය ප්‍රකාශන 2019.03.18 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවකට අනුව නිකුත් කිරීම සඳහා බලය පවරන ලදී.

**ජයා කටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්**

**මූල්‍ය ප්‍රකාශනවලට සටහන්**
**2018 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා**

**2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති.**

**2.1 පොදු ගිණුම්කරණ ප්රතිපත්ති**

**2.1.1 පිළියෙළ කිරීමේ පදනම**

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කරන ලද පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම 2007 අංක 07සමාගම් පනතට අනුකූල වේ.

**2.1.2 මිනුම් පදනම**

පහත දේ හැර මූල්‍ය ප්‍රකාශය සකසා ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනමිනි;

- කල්පිරීම දක්වා රඳවා තබා ඇති සහ ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද ණය සහ ලැබීම් ලෙස දක්වා ඇති මූල්‍ය උපකරණ.
- නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගය ලෙස හඳුනාගෙන ඇති නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා වන බැරකම්

සුදුසු ලෙස නිශ්චිත ප්‍රතිපත්තීන් අනුරූපී සටහන් තුළ අනාවරණය කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශනවල උද්ධමනකාරී සාධක සඳහා ගැලපුම් කර නැත.

**2.1 3. අනුකූලතාව පිළිබඳ ප්‍රකාශයඅනුකූලතාව පිළිබඳ ප්‍රකාශය**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශය, වෙනත් පුළුල් ආදායම් ප්‍රකාශයක්, කොටස්වල වෙනස්වීම් ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ("මූල්‍ය ප්‍රකාශන") ඇතුළත් මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (CA Sri Lanka) සහ 2007 අංක 7 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවය අනුව නිකුත් කර ඇති පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKAS) අනුව සකස් කර ඇත.

**2.2 වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ උපකල්පනයන්**

SLFRS / LKAS හි අනුකූලතාවයට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහා ද්ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කරන ලද වත්කම්, වගකීම්, ආදායම සහ වියදම් ප්‍රමාණයට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන කළමණාකරනය කිරීම අවශ්‍ය වේ. විනිශ්චයන් සහ ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ ඓතිහාසික අත්දැකීම් සහ තත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන අපේක්ෂාවන් ඇතුළු වෙනත් සාධක මත ය. එබැවින් සත්‍ය අත්දැකීම් සහ ප්‍රතිඵල මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ යටින් පවතින උපකල්පන අඛණ්ඩ පදනමින් සමාලෝචනය කරනු ලැබේ. ක්‍රමානුකූල පදනමක් මත වන්දි ගෙවීමට අදහස් කරන පිරිවැයට ඒවා ගැලපීමට අවශ්‍ය කාල සීමාවන් තුළ ආදායම ලෙස පිළිගත් සංශෝධන.

**a) අඛණ්ඩ පැවැත්ම**

අධ්‍යක්ෂකවරුන් විසින් සමාගමට අඛණ්ඩව පැවතීමට ඇති හැකියාව ඇගයීමට ලක් කර ඇති අතර පූර්වේක්ෂී ඉදිරි කාලය තුළ අඛණ්ඩව පැවතීමට සමාගම සතුව සම්පත් ඇති බවට සෑහීමකට පත් වී ඇත. තවද සමාගමට අඛණ්ඩ පැවැත්මකට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයන් ඇති කරන වැදගත් අවිනිශ්චිතතාවක් කළමනාකාරීත්වයට දැනගන්නට නැත. එබැවින් අඛණ්ඩ පැවත්ම පදනම් කොටගෙන තවදුරටත් මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබේ.

**ජයා කටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්**

**මූල්‍ය ප්‍රකාශනවලට සටහන්**
**2018 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා**

**b) සේවක ප්‍රතිලාභ වගකීම:**

නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගය, උපකල්පන ගණනාවක් භාවිතා කරමින් ආයුගණක පදනම මත තීරණය කරන සාධක මත රඳා පවතී. අර්ථ දක්වා ඇති විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් තීරණය කිරීමේදී භාවිතා කරන ප්‍රධාන උපකල්පන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 12 හි දක්වා ඇත. මෙම උපකල්පනයන්ට සිදු කෙරෙන ඕනෑම වෙනස්කමක් නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ ධාරක අගයට බලපෑම් කරනු ඇත.

**c) බැඳීම් සහ අවිනිශ්චිතතා**

සියලුම දන්නා බැරකම්වල මුදල තීරණය කිරීමේදී සියලු තේරුම්ගත හැකි අවදානම් සලකා බලා ඇත.

